# අංගුත්තර නිකායේ තිකනිපාතය පිළිබඳ හැඳින්වීමක්.

**කර්කාචාර්ය, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති මැදගොඩ අභයතිස්ස හිමි**

සූත්‍රපිටකාගත නිකාය පඤ්චකයෙන් සිවුවෙනි ග්‍රන්ථය අංගුත්තර නිකායයි. එකින් එක වැඩිවන ආකාරයේ ඒකක, දුක ආදී නිපාත එකොළොසකින් සමුපලක්ෂිත පිටක ග්‍රන්ථයක් බැවින් එනමින් අංගුත්තරනිකාය හඳුන්වන බව අටුවාව පෙන්වා දෙයි.

**"එකකාදි අංගෙහි උපරූපරි උත්තරො අංකොති අංගුත්තරො"[1]**

**"කථමො අංගුත්තර නිකායො? එකෙක අංගාතිරෙක වසෙන ධීතානි චිත්තපරියාදානාදීනි නවසුත්තසහස්සානි පඤ්චසුත්තසතානි සත්තපඤ්ඤාසංච සුත්තානි"[2]**

බුද්ධ දේශිත ධර්මයෙහි අන්තර්ගත සංඛ්‍යාත්මක වශයෙන් වෙන්කොට ගත හැකි සූත්‍රයන්ගේ එකතුවක් වන අංගුත්තර නිකාය ධර්මය සංග්‍රහකොට තැබීමේ ඉතා වැදගත් පියවරක් වශයෙන් ද හඳුන්වාදිය හැකි ය. නිකාය පඤ්චකය පිළිබඳව විමසා බැලීමේ දී පෙනී යන්නේ ඉන් ප්‍රථම ද්විතීය නිකායද්වය ම දීඝ හා මජ්ඣිම යන නාමද්වයෙන් හැඳින්වෙන බව යි. දිග සූත්‍ර හා මධ්‍යම ප්‍රමාණයේ සූත්‍ර යන අර්ථයෙන් සූත්‍රයේ දිග පළල අනුව මෙම වර්ග කිරීම සිදුවී ඇත්නම් තෙවැන්න විය යුත්තේ ඛුද්දක නිකාය යි. කෙසේ හෝ වේවා ඛුද්දක නිකායාගත ග්‍රන්ථයන්හි අධිකත්වය පිළිබඳ අවධානය යොමුකළ ශාසනභාරධාරී තෙරවරුන් එහි එන නම් ගොත් හා ධර්ම කරුණු වශයෙන් සංගෘහිත සූත්‍ර එක් ගොනුවක් ලෙස ගෙන සංයුක්ත නිකාය ලෙසත්, සෙසු අංග වශයෙන් එකිනෙක වැඩිවන ආකාරයේ කරුණු ඇතුළත් සූත්‍ර ඒකකයක් වශයෙන් ගෙන අංගුත්තර නිකාය වශයෙන් සහ ඉතිරි කුඩා සූත්‍ර හා යථෝක්ත කොටස් දෙකෙහි ම ලා සලකාගත නොහෙන සූත්‍ර ඛුද්දකනිකාය ලෙසත් සංග්‍රහ කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. කෙසේ හෝ යථෝක්ත ඓතිහාසික සංවර්ධනයන් ද සහිතව නිපාත එකොළොසකින් සමන්විත අංගුත්තර නිකායක් අද අප ඉදිරියේ පවතී.

අංගුත්තරාගමය, ඒකුත්තරාගමය, අංගුත්තර සංගීති ආදී විවිධ නම් වලින් මෙම ග්‍රන්ථය හැඳින්වෙන අතර මහායාන ග්‍රන්ථයන් හි මෙය හඳුන්වා ඇත්තේ ඒකෝත්තරාගම වශයෙනි. අංගුත්තර නිකාය නිපාත එකොළොසකින් සමන්විත බව යට දැක්වීමු. එසේ ම සූත්‍ර නවදහස් පන්සිය පනස් හතකින් මෙය සමන්විත වේ.

**"නවසුත්තසහස්සානි - පඤ්චසුත්තසතානි ච**

**සත්තපඤ්ඤාසසුත්තානි - පංඛා අංගුත්තරෙ අයං"[3]**

මේ අනුව මෙම නිකාය සෙසු සියළු නිකායයන්ට වඩා සූත්‍ර ගණනින් ද භාණවාර ගණනින් ද අක්ෂර ගණනින් ද අධිකම ග්‍රන්ථය ලෙස පෙන්වා දිය හැකි ය. මනෝරථපූරණී අටුවාව පෙන්වා දෙනුයේ අංගුත්තරනිකාය ධර්මකථික පුරුෂෝත්තමයන්ට විසිතුරු ප්‍රතිභානය ජනනය කරන්නාවූ ග්‍රන්ථයක් වශයෙනි.

**"එකකදුකාදි පතිමණ්ඩිතස්ස අංගුත්තරාගමවරස්ස**

**ධම්මකථිකපුංගවානං විචිත්තපටිභාජනනස්ස"[4]**

එසේ ම අංගුත්තර නිකාය ධර්ම කථාවෙහි නිපුණතාව වඩවන ග්‍රන්ථය ලෙස මනෝරථපූර්ණී නිගමනගාථාව පෙන්වා දෙයි.

**"ධම්මකථාය නිපුණපරමනිකායස්සට්ඨකථං ආරද්ධො**

**යමහං චිරකාලට්ඨිති මිච්ඡන්තො සාසනත්ථානං"[5]**

ප්‍රථම සංගායනාවේ දී සූත්‍රපිටකය සංගායනා කොට අනුරුද්ධ හිමියන් ප්‍රධාන ශිෂ්‍ය පරපුරට අංගුත්තර නිකායේ භාරධාරිත්වය පවරණ ලද බව ශාසන ඉතිහාසය පෙන්වා දෙයි. එතැන් පටන්

ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් වාචෝද්ගත කොටගෙන පවත්වාගෙන ආ මෙය අළුවිහාර සංගායනාවෙන් අනතුරුව ග්‍රන්ථාරූඪ කරන ලදී. මෙහිලා අප විසින් කෙටි හැඳින්වීමක් ලෙස පමණක් අංගුත්තර නිකාය පිළිබඳව සඳහන් කළ ද ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් සැපයීමට මෙය අවස්ථාවක් නොවේ. අංගුත්තර නිකායේ තෙවැනි පරිච්ඡේදය වන "තිකනිපාතය" පිළිබඳ කෙටි හැඳින්වීමක් පමණක් සිදුකිරීම මෙම කුඩා ලිපියේ අරමුණ වේ.

අංගුත්තර නිකායේ තික නිපාතය පණ්ණාසක තුනකින් ද, වර්ග දහ අටකින් ද, සූත්‍ර තුන්දහස් හතලිස් දෙකකින් ද සමන්විත ය. එහි සූත්‍රයන් එකිනෙක විශේෂ නාමයන්ගෙන් හඳුන්වා ඇති බවක් නොපෙනෙතත් වර්ග වශයෙන් පැහැදිළිව බෙදා දක්වා ඇත.

බාලවග්ග, රථකාරවග්ග, පුග්ගලවග්ග, දේවදූතවග්ග, චූලවග්ග, බ්‍රාහ්මණවග්ග, මහාවග්ග, ආනන්දවග්ග, සමනවග්ග, ලොණඵලවග්ග, සම්බෝධිවග්ග, අපායිකවග්ග, භණ්ඩුවග්ග, යොධාජීවවග්ග, මංගලවග්ග, පටිපදාවග්ග, කම්මපථපෙය්‍යාල, රාගපෙය්‍යාල,

යනුවෙන් වර්ග දහ අටක් මෙහි දක්නට පිළිවන. ඒ ඒ වර්ගයට අයත් සූත්‍රයන්ගේ විෂය අනුව සලකාගෙන ඇතැම් වර්ගයන් නම්කොට ඇති අතර තවත් වර්ගයක් නම්කොට ඇත්තේ වර්ගයේ ආරම්භක සූත්‍රයට අනුව ය. දේශනාවේ දී සම්බන්ධ වූ ශ්‍රාවකයාගේ නමින් ඇතැම් වර්ගයක් නම් කෙරේ. මීට අමතරව එම වර්ගයෙහි විශේෂයෙන් සාකච්ඡා කෙරෙන ධර්මපර්යාය අනුව සලකාගෙන වර්ග නම් කිරීම ද මෙහි දැකිය හැකි ය.

අංගුත්තරනිකාය තිකනිපාතයේ සූත්‍ර සමස්ථයක් වශයෙන් ගත්කල වැඩි අවධානය යොමු කොට ඇත්තේ ධර්ම කරුණු සංක්ෂේපයෙන් අංකිතව ඉදිරිපත් කිරීම කෙරෙහි ය. එසේ වෙතත් මෙහි සූත්‍රයන් දෙස විමසුම් සහිතව අවධානය යොමු කිරීමෙන් සාමාජික, දේශපාලනික, ආර්ථික, සංස්කෘතික හා සාහිත්‍යයික වැදගත්කමකින් පෝෂිත සූත්‍ර බොහෝ ගණනක් දක්නට පිළිවන. කෙසේ වතුදු දාර්ශනික වශයෙන් වැදගත් වන අංශය කෙරෙහි අංගුත්තර නිකායේ විශේෂ අවධානය යොමුවී ඇති බව පැහැදිලි ව දක්නට පිළිවන.

සමාජය යනු පුද්ගල සමවායයෙන් සකස් වූවකි. සමාජයේ යහපැවැත්ම රඳා පවතිනුයේ එහි සාමාජිකයන්ගේ ආචාර සමාචාර හා ඇවතුම් පැවතුම්වල ඇති ගුණාත්මක බව අනුව ය. බාලයන් ඇසුරු නොකිරීම මංගල ලක්ෂණයක් ලෙස මංගල සූත්‍රය පෙන්වා දෙයි. බාලයා යනු කවරෙක් දැයි කරුණු තුනකින් හඳුනාගත යුතු බව තිකනිපාතාගත මුල් ම සූත්‍රය පෙන්වා දෙයි. පණ්ඩිතයන් සේවනය කිරීමට අනුදත් බුදුදහම පණ්ඩිතයා යනු කවරෙක් දැයි එහි ම දෙවැනි සූත්‍රයෙන් පෙන්වා දෙයි. පොහොය දිනය හා පෙහෙවස් විසීම බෞද්ධ සංස්කෘතියේ ඉතා වැදගත් සාමජික වටිනාකමක් දරන්නකි. මෙහි එන විසාඛූපොසථසූත්‍රය[6] ඒ පිළිබඳ ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍රයක් වශයෙන් වැදගත් වන්නකි. මෙහිලා චුල්ලවග්ගපාලි උපොසක්ඛන්ධකයේ එන බිම්බිසාර රජුන්ගේ ආරාධනයෙන් පොහොය දිනය පැණවීමට අදාළ ප්‍රවෘත්තිය ද සැලකිල්ලට ගැනීම සුදුසු ය.[7]

පෙරදිග සමාජයේ මව්පියන්ට හිමිවනුයේ ඉතා වැදගත් ස්ථානයකි. එහෙත් හින්දු ඉගැන්වීම් සහිත භාරතීය සමාජයේ ලෝක නිර්මාපකයා ලෙස සැලකුම් ලැබුයේ බ්‍රහ්මන් ය. බුදුරදුන් බ්‍රහ්ම සංකල්පයට නව අර්ථකථකයක් සපයනුයේ මව්පියන් බ්‍රහ්මයන් ලෙස පෙන්වා දෙමිනි.

**"බ්‍රහ්මාති මාතාපිතරො - පුබ්බාචරියාති වුච්චරෙ**

**ආහුණෙය්‍යා ච පුත්තානං - පජාය අනුකම්පකා"[8]**

අපාය පිළිබඳ සංකල්පය බෞද්ධයන්ට පමණක් ආවේණික වූවක් නොවේ. හින්දු, ඉස්ලාම්, කතෝලික ආදී සියලු ආගමික ඉගැන්වීම් තුළ අපාය පිළිබඳ ඉගැන්වීම පිළිගැනේ.[9] එහෙත් ඇතැමුන් අපාය යනු මෙලොව ම ඒකදේශයක් ලෙස විවරණය කිරීමට කැමති වෙති. අපාය යනු සජීවී ක්‍රියාකාරිත්වයක් සහිත වරදට දඬුවම් පමුණුවන ස්ථානයක් ලෙස අංගුත්තරනිකායේ තිකනිපාතාගත දේවදූත සූත්‍රය පෙන්වා දෙයි.[10] අපාය පිළිබඳ විස්තරවන ඉතා වැදගත් සූත්‍රයන් කිහිපයක අතර සුවිශේෂී සූත්‍රය ලෙස මෙය හඳුන්වා දිය යුතු ය.

සොරකම යනු වර්තමාන සමාජයේ පමණක් පවත්නා සමාජ විෂමතාවක් නොවේ. එය අතීතයේ ද එලෙස ම පැවතුනි. ඇතැම් සොරෙක් හුදෙකලාව සොරකමේ නියැලි අතර තවත් සොර පිරිසක්

කණ්ඩායම් වශයෙන් ක්‍රියා කළහ. ආටානාටිය සූත්‍රයේ සොරකණ්ඩායම් පිළිබඳ විස්තරයක් එයි.[11] එසේ ම ජාතක කථාවන් හි විවිධ සොර කණ්ඩායම් පිළිබඳ තොරතුරු හමුවේ. අංගුත්තරනිකායේ තිකනිපාතයේ චූලවග්ගයේ අවසාන සූත්‍රය සොරෙකුගේ ලක්ෂණත්‍රයක් ඇති බව පෙන්වාදෙයි.[12] මෙය භාරතීය සමාජයේ පැවති සමාජ විද්‍යාත්මක ලක්ෂණයන් පිළිබිඹු කරන සුවිශේෂී සූත්‍රයකි.

ආගම්වලට බලෙන් බඳවා ගැනීම හා ආගම් හැරයාම මෙකල නිතරම පාහේ සාකච්ඡාවට බඳුන්වන කරුණකි. බුදුන් දවස ද "සරභ" නම් පිරිවැජියෙක් බෞද්ධ උවසුවෙකු ලෙස සිට අනතුරුව බුදුදහම කෙරෙහි අප්‍රසාදය පළකරමින් සිදුකළ විප්‍රකාරයක් තිකනිපාතයේ හමුවෙයි. මෙය යථෝක්ත සමාජයේ විසූ දෘෂ්ටිගතික පුද්ගලයන් පිළිබඳව හෙළිවන තොරතුරක් පමණක් නොව තමා අදහමින් සිටි ලබ්ධියෙහි සැක කිරීම හා එම ලබ්ධියට බැණවැදී නිග්‍රහ කිරීමට පෙළඹීමේ මිනිස් මනස විග්‍රහ කෙරෙන වැදගත් ස්ථානයකි. නිරන්තරයෙන් උභයාන්තය භජනය කිරීමේ පොදු මිනිස් දුබලතාව මෙහි ද ප්‍රකට වෙයි.[13] මීට අමතරව බුද්ධකාලීන සමාජයේ විසූ නිගණ්ඨ, ආජීවක, පාෂාණ්ඩ හා පරිබ්‍රාජකාදී නොයෙක් ආගමික කණ්ඩායම් පිළිබඳව ද ඔවුන්ගත් ලබ්ධීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ද මෙහි සූත්‍ර වලින් තොරතුරු සපයා ගත හැකි ය.

නාගරික ජීවිතය, එහි සංවර්ධනයත් සමග හටගත් දූෂණ වංචා ආදියත්, රටක පැවැත්ම රක්නා රජුන් ඇමතියන් හා ඔවුන් මුහුණ දෙන යුද්ධ ආදී ගැටළු සහ ඔවුන් ඒ සඳහා මුහුණ දෙන ආකාරය වැනි දහසකුත් එකක් සමාජීය වැදගත්කම් සහිත කරුණු ඇතුළත් සූත්‍ර මෙම නිපාතයේ දක්නට ඇත.

අංගුත්තරනිකායේ තික නිපාතය බෞද්ධ දාර්ශනික කරුණු අන්තර්ගත දේශනාවන්ගෙන් පරිපෝෂිත කාණ්ඩයක් ලෙස ද පෙන්වා දිය යුතු ය. මහාතිර්ථායතන සූත්‍ර නාමයෙන් හැඳින්වෙන පුබ්බේකතහේතුවාද, ඉස්සරනිම්මානවාද හා අහේතුඅප්පච්චයවාද යන දෘෂ්ටිවාදයන් ප්‍රතික්ෂේප කරන සූත්‍ර කිහිපයක් ම මෙහි හමුවේ.[14] බුදුදහමේ සිතීමේ හා විමසීමේ නිදහස අර්ථවත් වන ඉතා වැදගත් සූතයක් සේ පෙන්වා දියයුතු කාලාම සූත්‍රය ද[15] අන්තර්ගත වනුයේ මෙම නිපාතයට ය. බුදුදහම පෙන්වා දෙනුයේ කිසිවෙකුට කිසිවෙක් අපිරිසිදු කිරීම හෝ පිරිසිදු කිරීම නොකළ හැකි බවත් එය තමා විසින් ම කරගත යුත්තක් බවත් ය.[16] කාය වාග් මනෝ යන ද්වාරත්‍රයෙහි දූෂිත බව හේතුවෙන් අයෙක් අපිරිසිදු වන අතර ඒවායේ පිරිසිදු බව කරණකොට ගෙන පිරිසිදු වෙයි.[17] චක්ෂුරාදී ඉන්ද්‍රියයන් බාහිර අරමුණු හා ගැටීමෙන් ඇතිවන සුභ සංඥාව හේතු සාධක වීමෙන් රාගාදිය වර්ධනය වෙයි.

පුද්ගල විවිධත්වය අධිගමයන් සඳහා ඍජු බලපෑම් ඇති කරයි. ප්‍රඥාවේ ප්‍රභේද තුනක් වන අතර එම ප්‍රභේදයන්ට අනුව පුද්ගලයාගේ අවබෝධ ශක්තිය වෙනස් වේ. අවකුජ්ජපඤ්ඤා, උච්චංගපඤ්ඤා හා පුථුපඤ්ඤා[18] යනුවෙන් යථෝක්ත ප්‍රඥා ස්ථරයන් මෙහි වර්ගකොට දක්වේ.

අභිධර්මයෙහි කුසලාකුසල කර්මයන්ට බලපවත්නා හේතු ලෙස දක්වනුයේ ලෝභ, දොස, මෝහ හා අලෝභ, අදෝස, අමෝහ යන චෛතසිකයි.[19] ලෝකස්වභාවය පිළිබඳව කෙරෙන ඉතා වැදගත් නිර්වචනයක් ලෙස සංඛත ධර්ම විග්‍රහය පෙන්වා දිය හැකි ය. එහිලා උප්පාද, වය, ඨිතස්ස අඤ්ඤතත්ථභාව වශයෙන් සියලු සංස්කාරයන්ගේ යථා ස්වභාවය විස්තර කෙරේ.[20] මීට අමතරව ජීවිත යථාර්ථය පිළිබඳව හෙළි කරන සූත්‍ර ධර්ම බොහෝ ප්‍රමාණයක් ද අංගුත්තරනිකායේ තික නිපාතයේ හමුවේ.

**"උපනීයති ජීවිතමප්පමායු - ජරූපනීතස්ස න සන්ති තාණං**

**එතං භයං මරණෙ පෙක්ඛමානො - පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි"[21]**

නිරන්තරව මරණය කරා යන අල්පායුෂ්ක ජීවිතයේ හරය සුවගෙන දෙන පිංකම් කිරීමෙන් ලබාගන්නා ලෙස මෙමගින් උපදෙස් දෙයි. මෙම ජීවිතය ගිනිගෙන දැවෙන ගෙයක් ලෙසත් එයින් යමක් මතු ප්‍රයෝජනය හා ඉතිරි කරගන්නේ නම් එය කුසල ශක්තිය පමණක් බවත් මෙහිලා විස්තර කෙරෙයි.[22]

අන්ධවේණු උපමාව පාලි සාහිත්‍යයේ ඉති ප්‍රසිද්ධ වූවකි.[23] එසේ ම අන්ධ යන වචනයෙන් හඳුන්වනුයේ ඇස් පෙනීම නොමැති පුද්ගලයා වුවත් බුදුදහම එයට දෙන අර්ථ කථනය වන්නේ ගුණ නුවනින් තොර මෙලොව පරලොව යහපත නොදක්නා පුද්ගලයා බවයි. අන්ධබාලපුථුජ්ජන යන

වචනයෙන් නැණ ගුණ හීනයන් හඳුන්වා ඇත්තේ එබැවිනි. එක් අතකට වක්‍රෝක්තියක් වශයෙන් හඳුනාගත හැකි ගාථාවක් තික නිපාතයේ හමුවේ.

**"අන්ධං ච එකචක්ඛුං ච - ආරකා පරිවජ්ජයෙ**

**ද්විචක්ඛුං පන සෙවෙථ - සෙට්ඨං පුරිසපුග්ගලං"[24]**

ගුණ නුවණින් තොර පුද්ගලයා අන්ධයා වශයෙන් ද ඉන් එකක් අඩු තැනැත්තා ඒකචක්ඛු යනුවෙන් ද පෙළෙහි හඳුන්වා ඇත. ඔවුන් මුළුමනින් ම දුරුකළ යුතු බවත් ගුණ නුවනින් යුතු ශ්‍රේෂ්ඨ පුද්ගලයින් පමණක් ඇසුරු කළයුතු බවත් මෙ මගින් පෙන්වා දෙයි.

ඉතා විශිෂ්ඨ ගණයේ සාහිත්‍යාත්මක වර්ණණාවක් ලෙස ගතහැකි සූත්‍රයක් මෙම කොටසෙහි එයි. එය හිමපාතසමය පිළිබඳ වූවකි.

"සීතා භන්තෙ, හෙමවන්තිකා රත්ති, අන්තරට්ඨකො හිමපාතසමයො, ඛරා ගොකණ්ඨහතා භූමි. තණුකො පණ්ණසන්ථරො විරළානි රුක්ඛස්ස පත්තානි. සීතානි කාසායානි වත්ථානි. සීතො ච වෙරම්භවාතො"[25]

"ස්වාමීනි, හේමන්තයට අයත් රැය සීතලය. හිම වැටෙන කාලය වේ. බිම රළුය. බිම ගෝකුරයෙන් බිඳ ඇත. පත් ඇතිරිය තුනීය. ගසේ කොල ද විරළය. කසාවත ද සිහිල් ය. වේරම්භවාතය ද සිහිල් ය."

යථෝක්ත පාඨයෙහි බුදුරදුන් හේමන්ත සමයක අලවි නුවර වැඩසිටි අවදියක් පිළිබඳ තොරතුරු අනාවරණය වෙයි. එහි හිමපාත සමයෙහි රළු බව හා සාමාන්‍ය පෘථග්ජනයෙකුට එහිලා වන විසය්හතාව පෙන්නුම් කරයි.

බුද්ධචරිතය හා සම්බන්ධ තොරතුරු සොයා යාමේ දී අංගුත්තරනිකායාගත ඉගැන්වීම් වලින් ඉතා වැදගත් ආලෝකයක් සපයා ගත හැකි ය. දේවදූතවර්ගයේ එන සූත්‍රයක හත්ථාලවක බුදුරදුන් හමුවට ඇවිටේරියා වනයට පැමිණීම හා එහිදී හමුවූ සිදුවීම් වාර්තා වෙයි.[26] මජ්ඣිම නිකායේ ද මීටම සමාන සූත්‍රයක් හමුවේ. එසේ ම බෝසතාණන් වහන්සේ සිය කුමාර ජීවිතය පිළිබඳව කරන ස්වයං ප්‍රකාශයනයක් ද මෙහි අපට හමුවෙයි.

**"තස්ස මය්හං භික්ඛවෙ තයො පාසාදා අහෙසුං. එකො හෙමන්තිකො, එකො ගිම්හිකො, එකො වස්සිකො. සො ඛො අහං භික්ඛවෙ වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරොමාසෙ නිප්පුරිසෙහි තුරියෙහි පරිචාරියමානො න හෙට්ඨාපාසාදං ඔරොහාමි"[27]**

තමන් වහන්සේ ඉතා සියුමැලි සුකුමාර ජීවිතයක් ගතකළ ආකාරය ඉහත කරන ලද ආත්ම ප්‍රකාශය තුලින් මැනවින් නිරූපණය වේ. මීට අමතරව බුදුරජාණන් වහන්සේගේ ජනපද චාරිකාවන් ආදිය පිළිබඳ ඉඉතා වැදගත් තොරතුරු රැසක් ද අංගුත්තර නිකායේ තිකනිපාතාගත සූත්‍රයන් තුළ අන්තර්ගතව ඇත.

සංස්කෘතිකමය වශයෙන් භාරතීය සමාජය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට ද මෙමගින් හැකියාව සැලසෙයි. සතරවරම් දෙවිවරුන් පිංකරන්නවුන් සොයා හැසිරීම පිළිබඳ අදහස හින්දු සංස්කෘතියට පමණක් නොව ස්ලාම් හා කතෝලික ආගම්වල දක්වෙන සබානිවරුන් හා දේවදූතයන් ගැන එන සිහිගන්වයි.[28] වච්ඡගොත්තපරිබ්‍රාජක, තිකණ්ණ පරිබ්‍රාජක, ජාණුස්සොණි බ්‍රාහ්මණ, සංගාරවබ්‍රාහ්මණ ආදීන් ට ධර්මය දෙසීම ද ඔවුන් බුදුසමයේ ප්‍රසාදයට පත්වීම ආදී තොරතුරු ධර්ම ගම්භීරත්වයෙන් ඉතා අධික දේශනාවන් ය.

විනය නීත පැණවීමට පෙරාතුව භික්ෂුවගේ සංවරය සකස් වූයේ ඔවාද ප්‍රාතිමෝක්ෂය ඇසුරු කොටගෙනය. භික්ෂුවගේ ආචාරශීලී පැවැත් පිළිබඳව පිළිබිඹු කෙරන වැදගත් සූත්‍රයකි අපණ්ණක සූත්‍රය.[29] එහි ලා "භොජනෙ මත්තඤ්ඤුතාව" හා "ජාගරියානුයෝගීබව" ආදිය පිළිබඳ විස්තර අන්තර්ගත ය. එසේ ම භික්ෂූන්වහන්සේගේ දිනචරියාව සකස් විය යුතු ආකාරය පිළිබඳව ද තොරතුරු මෙමගින් සපයා ගත හැකි ය.

බුදුදහම පරමාර්ථ සත්‍ය ප්‍රකාශ කෙරන ධර්මයක් වුවත් පොදු ජනයාට ඉදිරිපත් කළ යුත්තේ සම්මුතිය ඇසුරු කර ගනිමිනි. එහි සාමාන්‍ය සමාජයේ භාවිත කෙරෙන උපමා, රූපක, වක්‍රෝක්ති ආදිය භාවිත කිරීමට සිදුවේ. මෙහි දු ඇතැම් ගැඹුරු සංකල්පයක් සරළව පෙන්වා දීමට දෘෂ්ඨාන්ත භාවිත කර තිබෙනු දක්නට හැකි ය. මෙහි භාවිත සිත හා අභාවිත සිත අතර වෙනස පෙන්වා දෙනුයේ සත්දිනක් අඩු සමසකින් නිමවූ රියසක හා සදිනකින් නිමවූ චක්‍රයෙහි උපමාවෙනි. භික්ෂුව තමාගේ ආධ්‍යාත්මික ජීවිතය පෝෂණය කරගත යුතු ආකාරය පෙන්වා දෙනුයේ වෙළෙන්දෙකු සිය වෙළඳාමෙන් ලාභ ලබන ආකාරය උපමාවට ගැනීමෙනි.[30] වේනාග පුරයට වැඩමවන බුදුරජාණන් වහන්සේගේ ඡවි වර්ණය පිළිබඳව එන වර්ණනාව උපමා රූපක සංයෝජනයෙන් කරන ලද ඉතා විසිතුරු වූවකි.

"සෙය්‍යථාපි භො ගොතම සාරදං බදරපණ්ඩුපරිසුද්ධං හොති පරියොදාතං එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. සෙය්‍යථාපි භො ගොතම තාලපක්කං සම්පති බන්ධනා පමුත්තං පරිසුද්ධං හොති පරියොදාතං. එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි. පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො."[31]

සරභ පරිබ්‍රාජකයා සම්බන්ධ ප්‍රවෘත්තිය ඉතා රසවත් සාහිත්‍යාත්මක වර්ණනාවන් කැටිකොට නිර්මාණය වී ඇති අයුරු ආශ්වාදනීය වෙයි. බුදුරදුන් පිරිහෙළා කථාකළ සරභ සෙසු පරිවැජියන් විසින් නිගාවට පත් කරනුයේ,

සරභය, මහාවෙනෙහි ජර සිවලෙක් සිහනද කරන්නෙමි යි සිවල් හඬම නගා ද, බුන් හඬම නගා ද ඔබ ද සිහනද කරමියි කැණහිල් හඬම නගන්නෙහි ය. කුඩා කිකිළියක් මහ කුකුළු හඬ නගන්නෙමි යි යම් සේ කුඩා කිකිළි හඬම නගයි ද තෝත් එසේ ය. යම් සේ ගොනෙකු හිස් ගවගාලෙක මහගොනෙකුගේ හඬ නගන්නට තැත් කරන්නේ ද එසේ නුඹ බුදුරදුන් පිරිහෙලීමට උත්සාහ දරන්නෙහි ය.[32]

ආදී වශයෙන් මෙහි ස්වභාවික පරිසරයෙන් ලබාගත් නින්දාරහ උපමා සංයෝජනය අභිප්‍රේතාර්ථය කුළුගැව යි. මේ අනුව අංගුත්තර නිකායේ තිකනිපාතාගත සූත්‍රයක් පොදුවේ ගත් කල බෞද්ධ දාර්ශනික කරුණු පෙළගැස්සූ ධර්ම කෝෂයක් සේ ම බුද්ධ චරිතය, භාරතීය සමාජය, භික්ෂු ජීවිතය, සාහිත්‍යයික වර්ණනා ආදී නොයෙක් විෂය පථයන් කෙරෙහි විහිදී ගිය ධර්ම පර්යායයක් ලෙස පෙන්වා දීමට හැකි ය.

***පාදක සටහන්***

1. අංගුත්තරනිකාය, ඒකකනිපාතටීකා, ගන්ථාරම්භකථාවණ්ණනා.

2. සුමංගලවිලාසිනි, හේවාවිතාරණ මුද්‍රණය, 1918, 18 පිට.

3. එම, 18 පිට.

4. මනෝරථපූරණී, ගන්ථාරම්භකථා.

5. මණොරථපූරණී, නිගමනගාථා.

6. අංගුත්තරනිකාය, කොළඹ, 1960, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (බු.ජ.මු.), විසාඛුපොසථවත්ථු.

7. මහාවග්ගපාලි (විනය පිටක) උපොසථක්ඛන්ධකය.

8. අංගුත්තරනිකාය, බු.ජ.මු. 244 පිට.

9. බලන්න, අපාය, මැදගොඩ අභයතිස්ස හිමි, කොළඹ, 2003.

10. අංගුත්තරනිකාය, බු.ජ.මු. 2543 පිට.

11. දීඝනිකාය, පාථිකවග්ග, ආටානාටියසුත්ත.

12. අංගුත්තරනිකාය, බු.ජ.මු. 276 පිට.

13. මජ්ඣිමනිකාය, කච්චායනගොත්ත සුත්ත.

14. අංගුත්තරනිකාය, බු.ජ.මු. මහාතීර්ථායතන සූත්‍ර.

15. අංගුත්තරනිකාය, බු.ජ.මු. 336 පිට.

16. සුද්ධි අසුද්ධිපච්චත්තං නාඤ්ඤමඤ්ඤං විසොධයෙ, ධම්මපද.

17. අංගුත්තරනිකාය, බු.ජ.මු. 214 පිට.

18. අංගුත්තරනිකාය, බු.ජ.මු. 242 පිට.

19. අභිධම්මත්ථසඞ්ගහො, හෙතුපරිච්ඡෙද.

20. අංගුත්තරනිකාය, බු.ජ.මු. 274 පිට.

21. අංගුත්තරනිකාය, බු.ජ.මු. 280.

22. අංගුත්තරනිකාය, බු.ජ.මු. 282 පිට.

23. උදානපාලි, ජච්චන්දසුත්ත.

24. අංගුත්තරනිකාය, බු.ජ.මු. අන්ධ සුත්ත.

25. අංගුත්තරනිකාය, බු.ජ.මු. 252 පිට.

26. අංගුත්තරනිකාය, බු.ජ.මු. දෙවදූතසුත්ත.

27. අංගුත්තරනිකාය, බු.ජ.මු. 264 පිට.

28. අපාය, කොළඹ, 2003.

29. අංගුත්තරනිකාය, බු.ජ.මු. 216 පිට.

30. අංගුත්තරනිකාය, බු.ජ.මු. 220 පිට.

31. අංගුත්තරනිකාය, බු.ජ.මු. 322 පිට.

32. අංගුත්තරනිකාය, බු.ජ.මු. 334 පිට.

Typed by - Rev, Maturata Pannnananda (for the Magazine of past students of Vidyodaya)